**නිපුණතාවය** - පරිසරයේ පවත්නා ද්‍රව්‍ය සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.

**නිපුණතා මට්ටම** - ස්වාභාවික හා නිර්මිත වස්තූන් සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.

**ක්‍රියාකාරකම** - ශබ්දකෝෂයක්, ඇන්තූරියම් පැලයක් සහිත මල් පෝච්චියක් හා රෙදි කඩක් සම්පිණ්ඩණය කරයි.

**පැවරුම** - පහත දැක්වෙන පියවර අනුව ක්‍රියාකාරකමෙහි නියැලෙන්න.

1. ඔබ නිවසේ ඇති ශාක පත්‍ර දෙකක්, ඝනකාහ හැඩැති වස්තුවක් විවිධ හැඩයේ බඳුන් තුනක් සපයාගන්න.
2. මෙම එක් එක් භාණ්ඩ හොඳින් නිරීක්ෂණය කරමින් ඒවායේ හැඩය, මතුපිට ස්වභාවය, වර්ණය ආදිය පිළිබඳ අවබෝධය ලබාගන්න.
3. ඉහත ලබාගත් අවබෝධය අනුව එම භාණ්ඩ වෙන වෙනම දළ සටහන් අඳින්න.
4. සුදුසු පරිදි ඒවායේ ත්‍රිමාන බව පෙනෙන ලෙස එම දළ සටහන් පැන්සල භාවිතාකරමින් එළිය අඳුර යොදන්න.
5. ඉහත 1, 2, 3, 4 පියවර වලදී ලබාගත් අවබෝධයෙන් ශබ්දකෝෂයක්, ඇන්තූරියම් පැලයක් සහිත මල් පෝච්චියක්, රෙදි කඩක් සපයා ගෙන ඒවා සම්පිණ්ඩනයක් ලෙස සකසා ඒවායේ සුවිශේෂීතා ඉස්මතු වන පරිදි ඇඳ වර්ණ කරන්න.